**නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ ස්ථාපිත කිරීමේ මාර්ගෝපදේශය**

පවුල් සෞඛ්‍ය වැඩසටහන සෞඛ්‍ය පද්ධතියේ මට්ටම් කීපයක් ඔස්සේ ක්‍රියාත්මකවේ.පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි මට්ටම එහි මූලිකම ස්ථරය වේ. සේවාවේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා වරින් වර පවත්වා ගත යුතු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි කොට්ඨාශය ගණන පිළිබඳව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. ඒ අනුව නව කොට්ඨාශ හදුනාගත හැක අතර හි අරමුණ වන්නෙ සේවයේ ගුණාත්මක හා කාර්ය මණ්ඩලයෙ උපරිම කාර්යක්ෂමතාවය පවත්වා ගැනීමත්ය.

මෙම මාර්ගෝපදේශය අනුව ක්‍රියා කිරීමෙන් නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ හඳුනාගැනීම හා ස්ථාපනය කිරීම විධිමත් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ නිර්මාණය කිරීම පහත සඳහන් පරිදි සිදු වේ.

1.නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ හඳුනාගැනීම

1.1 නිසි අවශ්‍යතාවයක් පවතීනම් පමණක් වසර 5කට වරක් පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ සංඛ්‍යාව සංශෝධනය කළ හැකිය.

එක් එක් පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශවලට නියමිත ජනගහනය අඩු කිරීමෙන් අදාල සේවාවෙහි ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා අදාල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීවරයා / නිළධාරිවරිය විසින් තම සේවා ප්‍රදේශය තුල නව කොට්ඨාශ ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගත යුතුය.

1.2 නව කොට්ඨාශ හඳුනාගැනීමේ නිර්ණායක.

එක් පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශයකට නියමිත ජනගහනය දළ වශයෙන් 3000කි. මෙම සංඛ්‍යාව අදාල ප්‍රදේශයේ ජන ඝණත්වය, භූ විද්‍යාත්මක ලක්ෂණ, අවදානම් සහගත ජන කණ්ඩායම් පැවතීම ආදී කරුණු ද සැලකිල්ලට ගනිමින් නිර්ණය කළයුතුය.

ජනගහනය 3000කට එක් කොට්ඨාශයක් බැගින් නම් කර අදාල පුරප්පාඩු පිරවීමෙන් අනතුරුව, එක් කොට්ඨාශයකට නියමිත ජනගහනය, ග්‍රාමීය ප්‍රදේශවල 1500ක් හා නාගරික ප්‍රදේශවල 2500ක් වන පරිදි නව කොට්ඨාශ නිර්ණය කළ හැක. (මේ සම්බන්ධව නිකුත් කර ඇති සෞඛ්‍ය ලේකම්ගේ FHB/DIR/GF/2012 දරණ මහජන සෞඛ්‍ය සේවාවේ පුරප්පාඩු සංඛ්‍යාව තීරණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය ද සැලකිල්ලට ගන්න.)

එක් පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශයක් ග්‍රාම නිළධාරී කොට්ඨාශ එකක් හෝ කීපයකින් සමන්විත විය යුතු අතර පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශයේ මායිම් හැම විටම ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ හෝ කොට්ඨාශවලට මායිම් විය යුතුය. මේ මගින් පරිපාලන අවශ්‍යතාවයන් අනෙකුත් දෙපාර්තමේන්තු හා එම ක්ෂේත්‍ර නිළධාරීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු මෙන්ම අධීක්ෂණ කටයුතු ද පහසු වනු ඇත.

එක් ග්‍රාම නිළධාරී කොට්ඨාශයක ජනගහනය, පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශයකට නියමිත ජනගහනයට වඩා ඉතා වැඩි වන අවස්ථාවලදී

එක් ග්‍රාම නිළධාරී කොට්ඨාශයකට වඩා කුඩා පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ නිර්ණය කිරීමට සිදුවේ. එබදු අවස්ථාවලදී නව කොට්ඨාශ මායිම් නිර්ණය කිරීම, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් නිර්ණය කර ඇති ජන සංගණන ඒකක (census block) වල මායිම් වලට අනුගතව කළයුතු වේ. (2001 ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු වාර්ථාවට අනුව ජන සංගණන ඒකකයක් යනු සංගණන සිතියම්කරණයට අනුව ග්‍රාම නිළධාරී කොට්ඨාශයක් තුළ පවතින ඒකකයන් වේ. ග්‍රාමීය ප්‍රදේශවල නම් නිවාස ඒකක/ වෙනත් ගොඩනැගිලි 60ක් පමණ හෝ නාගරික ප්‍රදේශවල නිවාස ඒකක/ වෙනත් ගොඩනැගිලි 80ක් පමණ මෙම සංගණන ඒකකයකට (Census block) අයත් වේ.) මෙහිදී අදාල ප්‍රදේශයේ ග්‍රාම නිළධරී සමඟ සම්බන්ධ වෙමින් මෙම සීමාකරණය කරගත යුතුවේ. මෙම ක්‍රමයට අනුව එකිනෙකට යාබද සංගණන ඒකක කීපයක් එක් පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශයක් ලෙස ගෙන සුදුසු පරිදි නම් කිරීම කළහැක.

නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ පිහිටුවීම පිළිබද යෝජනාව අදාල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී විසින්, තම ප්‍රදේශයේ මාතෘ හා ළමා සෞඛ්‍ය පිළිබද වෛද්‍ය නිළධාරී, (MO-MCH), වෛද්‍ය නිළධාරී- සැලසුම් (MO-Planning), විශේෂඥ ප්‍රජා වෛද්‍ය නිළධාරී සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාද සමඟ සාකච්ඡා කළයුතුය.

අනතුරුව මේ සමග ඉදිරිපත් කර ඇති ආකෘතිය භාවිතා කරමින් දැනට ඉන් පවත්නා සේවා තත්වය හා නව කොට්ඨාශ ස්ථාපිත කිරීමෙන් ප්‍රජාවට හා සේවාදායකයන්ට ප්‍රතිලාභ, යෝජිත නව කොට්ඨාශ සිතියම, යෝජිත සේවා සැපයීමේ ස්ථාන හා අදාල ජනගහනයන් දක්වමින් ඉදිරිපත් කළයුතුය.

2. . යෝජනාව අනුමත කිරීම

සකස් කරන ලද යෝජනාව වැඩිදුර සමාලෝචනය සඳහා ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය. ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දිස්ත්‍රික් විශේෂඥ ප්‍රජා වෛද්‍ය නිළධාරී, මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී (MOMCH) ඇතුළු නිළධාරීන් සමඟ නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ සම්බන්ධ යෝජනාව නැවත සමාලෝචනය කළයුතුය. මෙහිදී දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව දැනට සේවය කරන හා ලබාගතහැකි පවුල් සෞඛ්‍ය නිළධාරිනීන් සංඛ්‍යාව, නව කොට්ඨාශ සඳහා යටිතල පහසුකම් සැපයීමේ හැකියාව මෙන්ම, නව කොට්ඨාශයන් පිහිටවීම සඳහා සැබෑ අවශ්‍යතාවයක් පවතීද යන්න සහ එයින් අපේක්ෂිත ඵලදායීතාවයද සැලකිල්ලට ගත යුතුවේ. මානව සම්පත් හා යටිතල පහසුකම් සපයා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙතින්ද අනුමැතිය ලබාගත යුතුය.

3. නව කොට්ඨාශ සඳහා අවශ්‍ය පවුල් සෞඛ්‍ය නිළධාරිනීන් පත්කර ගැනීම

නව කොට්ඨාශ සඳහා අදාල නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව අනුමත කරගැනීම අවශ්‍ය වේ. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිළධාරී කාර්යාල මගින් එම පුරප්පාඩු වාර්ෂිකව පුරප්පාඩු ලයිස්තුවට ඇතුලත් කර අදාල පළාත් සෞඛ්‍ය බළධාරීන් හා පළාත් කළමණාකරන හා පුරප්පාඩු පිළිබඳ කොමිසම වෙතින් අදාල අනුමැතියන් ලබා ගත යුතුවේ.

4. නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ ප්‍රකාශයට පත් කිරීම

නව පුරප්පාඩු සංඛ්‍යාව අනුමත කර ගැනීමෙන් අනතුරුව පමණක් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී විසින් නව පවුල් සෞඛ්‍ය නිළධාරිනී කොට්ඨාශ ප්‍රකාශයට පත් කළයුතු වේ. අනුමත වී ඇති සේවක සංඛ්‍යාව අදාල සියළු කොට්ඨාශවලට ප්‍රමාණවත් නොවේ නම් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින්, දිස්ත්‍රික් ප්‍රජා වෛද්‍ය, විශේෂඥ ප්‍රජා වෛද්‍ය, සහ ළමා හා මාතෘ සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිළධාරී ඇතුළු තම කාර්ය මණ්ඩලයේ සහය ඇතිව සකස් කරන ලද ප්‍රමුඛතා ලයිස්තුවකට අනුව අදාල නිළධාරිනීන් පත් කළයුතු වේ.

5. නව පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනී කොට්ඨාශයන්හි සේවාවන් ස්ථාපනය කිරීම

තම කොට්ඨාශය තුල සේවය කරන පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනීන් අනුයුක්ත කිරීමට ඇති හැකියාව අනුව නව පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනී කොට්ඨාශයන්හි සේවාවන් ආරම්භ කිරීම, අදාල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් තීරණය කළයුතු වේ.

නව පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනී කොට්ඨාශයන්හි සේවාවන් ස්ථාපනය කර, සේවාවන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ පසු, අදාල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් වහාම, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ ඇගයීම් ඒකකයට (Monitoring & Evaluation Unit) ඒ බව දැන්විය යුතුය. ඒ අනුව අදාල නව කොට්ඨාශ e – RHMIS - විද්‍යුත් දත්ත පද්ධතියට ඇතුලත් කරනු ලැබේ.

6. නව පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනී කොට්ඨාශ තුල ස්ථාපනය කළයුතු අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම්

සේවාවන් පුළුල් කිරීමේ කාර්යයේදී අලුතින් ප්‍රකාශයට පත් කරන ලද පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනී කොට්ඨාශ මෙන්ම, නව සීමා නිර්ණයන්ට අනුව බෙදීමට ලක්වූ පෙර පැවති කොට්ඨාශ ද "නව කොට්ඨාශ" ලෙස සැලකිය යුතු වේ. මේ සියලු "නව කොට්ඨාශ" සඳහා පහත කටයුතු කළයුතු වේ.

- ජනගහණ සමීක්ෂණය හා සේවා අවශ්‍යතා ඇස්තමේන්තු කිරීම
- පවුල් සෞඛ්‍ය කොට්ඨාශයේ නව සිතියම සකස් කිරීම
- නව ලයිස්තු හා ලිපි ලේඛන ඇස්තමේන්තු ලබාගැනීම හා ආරම්භ කිරීම
- සේවා සැපයීම සඳහා අවශ්‍ය වන බඩු බාහිරාදිය සපයා ගැනීම
- සේවා සැපයීමේ ස්ථාන, එනම් බර කිරුමේ මධ්‍යස්ථාන, සායන, නව සායනික කාලසටහන් ආදිය සංශෝධනය.
- නව පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනී කාර්යාල සඳහා සුදුසු ස්ථානයක් හඳුනාගෙන එම කාර්යාල පිහිටුවීම සහ ඒ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.

7. ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී සහ අදාල අධීක්ෂණ නිළධාරීන් විසින් නව පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනී කොට්ඨාශවල සේවා සැපයීම සම්බන්ධයෙන් නිරතුරුවම අධීක්ෂණය කළයුතු වේ.

- "නව කොට්ඨාශ" වල ක්‍රියාකාරකම් අධීක්ෂණය හා සමාලෝචනය
- පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනීන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයාගැනීම පිළිබඳ සොයා බලා අවශ්‍ය උපදෙස් හා තීරණ ලබාදීම.
- සියලු සේවාවන් නිසි ලෙස ස්ථාපනය වනතුරු වැඩි වාර ගණනක් අධීක්ෂණය කිරීම.